**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය**

**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**

**නීතිවේදී උපාධි පාඨමාලාව - 2023/2024**

**06 වන මට්ටම**

**LLU 6813 - නීති විද්‍යාව**

**අවසාන විභාග පරීක්ෂණය**

**කාලය පැය 03 යි .**

---

**දිනය : 2025 මැයි මස 02** **වේලාව: ප.ව 2.00 - ප.ව 5.00**

---

**මුළු ප්‍රශ්න ගණන 07 යි.**

**ප්‍රශ්න 04 ක් සඳහා පමණක් පිළිතුරු සපයන්න.**

**අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

පහත දී ඇති සිදුවීම ප්‍රශ්න අංක 01 සහ 02 සඳහා අදාළ වේ.

2024 දෙසැම්බර් මස අවසාන සතියේදී , නොවීඩා රාජ්‍යයේ ජනාධිපති යූකින් එරට පාර්ලිමේන්තුව මගින් ගෙන එන ලද දෝෂාභියෝගයකින් ධූරයෙන් නෙරපා හරින ලදී. මෙම දෝෂාභියෝගය ගෙන ඒමට හේතුව වූයේ නොවීඩියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන උල්ලංඝනය වන අයුරින් 2024 වර්ෂයේ දෙසැම්බර් මස 03 වන දින යුද නීතිය ප්‍රකාශයට පත් කිරීමට ඔහු විසින් ගන්නා ලද මතභේදාත්මක තීන්දුවයි. තවදුරටත්, යුධ නීතිය ප්‍රකාශ කිරීමට බාධා කිරීම වැලැක්වීම සඳහා පාර්ලිමේන්තුවට හමුදා භටයන් පිටත් කර යැවූ බවටද ජනාධිපති යූකින් හට චෝදනා නැගුණි. මේ අතරතුර , ජනාධිපති යූකින්ගේ තීරණය අභියෝගයට ලක් කරමින් නොවීඩාහි පුරවැසියන් උද්ඝෝෂණයක් දියත් කරන ලදී. නොවීඩියානු මාධ්‍ය වාර්තා කර සිටියේ යූකින්ගේ මෙම තීරණ හමුවේ රාජ්‍යය දේශපාලන ව්‍යාකූලත්වයකට පත් වී ඇති බවයි. **කෙසේ වෙතත් සිය විත්තිවාචකයේ දී , යූකින් තර්ක කර සිටියේ සිවිල් ජන සමාජයේ ප්‍රතිවිරෝධී නැගීසිටීම වැළැක්වීම සඳහා කෙටි කාලීනව යුධ නීතිය පැනවීම අත්‍යන්ත ප්‍රතිචාරය වූ බවත් එසේ නොවුණහොත් සමස්ත රාජ්‍යයම බිඳ වැටීමේ අනතුරකට මුහුණ දීමට හැකිව තිබූ බවත්ය.** වර්ෂ 2025 අප්‍රේල් මස 04 වන දින නොවීඩාහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය යූකින්ට එරෙහි දෝෂාභියෝගය අනුමත කරන ලදී. අට දෙනෙකුගෙන් සමන්විත විනිසුරු මඬුල්ල වැඩිදුරටත් තීරණය කර සිටියේ , යූකින් විසින් යුධ නීතිය ප්‍රකාශයට පත් කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන උල්ලංඝනය කිරීමක් වන බවත්, එමගින් නිසි නෛතික කාර්යපටිපාටීන් අනුගමනය කිරීමට අපොහොසත් ව ඇති බවත් අධිකරණයේ ස්වාධීනත්වයට ද මැදිහත් වීමක් වන බවත්ය. නොවීඩා රාජ්‍යයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම තීරණය ප්‍රකාශයට පත් කිරීමේ දින පටන් දින 60 ක් ඇතුලත නව මැතිවරණයක් පැවැත්විය යුතු ය.

1 . ( අ ) සමාජ සම්මුති න්‍යාය අනුසාරයෙන් නොවීඩාහි තත්වය සුදුසු උදාහරණ සපයමින් විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

**( ලකුණු 15 යි )**

( ආ ) ජනාධිපති යූකින්ගේ විත්තිවාචකයේ හරය සැලකිල්ලට ගනිමින් ඔබට එය සදාචාරයට අනුගතව සාධාරණීකරණය කල හැකි ද යන්න විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

**( ලකුණු 10 යි )**

**( 15 + 10 = ලකුණු 25 යි )**

02. ( අ ) ජනාධිපති යූකින් විසින් යුධ නීතිය ප්‍රකාශයට පත් කිරීම ඔස්ටින්ගේ මතවාදයට අනුකූලව " ප්‍රකෘති නීතිය " ලෙස වර්ගීකරණය කල හැකිද යන්න විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

**( ලකුණු 05 යි )**

( ආ ) යථාදෘෂ්ටිවාදයේ හරය පදනම් වී ඇත්තේ නීතිය සදාචාරයෙන් වෙන් විය යුතුය යන සංකල්පය මතය. මෙකී දෘෂ්ටිකෝණයෙන් බලන කළ ජනාධිපති යූකින් විසින් ගන්නා ලද ක්‍රියාදාමයන් ඔබ විසින් සාධාරණීකරණය කරන්නේ කෙසේද ? විශ්ලේෂණය කරන්න.

**( ලකුණු 20 යි )**

**( 05 + 20 = ලකුණු 25 යි )**

03. 'නීති විද්‍යාත්මක ගුරුකුල අතුරින් ඓතිහාසික නීති ගුරුකුලය වනාහි සංකල්පනික වශයෙන් දුප්පත් සහ තරමක් විකේන්ද්‍රික සබඳතාවක් නිරූපණය කරන්නකි. සෑම කෙනෙකුම එයට ආචාරශීලී වන අතර කිසිවෙකු එය පැහැදිලිව ප්‍රතික්ෂේප නොකරයි, නමුත් සත්‍ය වශයෙන් කිසිවෙක් එය බැරෑරුම් ලෙස ද සලකන්නේද නැත. සමහර ලේඛකයන් එය (ඓතිහාසික නීති ගුරුකුලය) දහනවවන සියවසේදී ජර්මානු විශ්වවිද්‍යාලවල බුද්ධිමය ජීවිතය අභිප්‍රේරණය කිරීමට දැක්වූ දායකත්වය පිළිබඳව සඳහන් කර ඇත. තව සමහරෙක් එය සමාජ විද්‍යාත්මක නීති ගුරුකුලයේ පූර්වගාමියා ලෙසින් ද හඳුනාගෙන තිබේ.

RE Rodes, 'On the Historical School of Jurisprudence' (2004) 49 the American Journal of Jurisprudence 165.

ඉහත ප්‍රකාශය අනුසාරයෙන්, ඓතිහාසික නීති විද්‍යාත්මක ගුරුකුලයේ දාර්ශනික අවබෝධයේ පවත්නා සමකාලීන වටිනාකම් විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. සුදුසු උදාහරණ සපයන්න.

**( ලකුණු 25 යි )**

04 . 2023 සැප්තැම්බර් මස 17 වැනිදා රාත්‍රියේ කොළඹ මරදාන පිහිටි රතු පහන් දිස්ත්‍රික්කයේ ලෝටස් පටුමගේ තෙමහල් ලැගුම්හලක විසූ සමන්මලී සපරමාදු හෙවත් බිංදු නැමැති 46 වියැති ලිංගික ශ්‍රමික කාන්තාවකගේ අමානුෂික ඝාතනය මහජනතාවගේ හදවත් කම්පා කරන සිදුවීමක් විය. එදින රාත්‍රී 09.15 ට පමණ දෙවන මහලේ පඩිපෙළ අසල විවේක ගනිමින් සිටියදී චමින්ද කරුණාරත්න නැමැති චූදිතයා ඇයට හමු වී ඇති අතර එහිදී ඇය සමග උණුසුම් වචන සංවාදයක් සහිතව ගැටීමක් ඇතිව තිබේ. මෙයින් එක්වරම හදිසි කෝපයට පත් වූ චමින්ද සමන්මලීට තම වැලමිටෙන් හා දණහිසෙන් තදින් පහර දී කොණ්ඩයෙන් ඇදගෙන ගොස් ඇගේ හිස කොන්ක්‍රීට් බිත්තියක ගැසූ අතර , ඒ හේතුවෙන් දැඩි රුධිර වහනයක් ඇතිවිය. ලැගුම්හලේ සේවයේ නියුතු ගෘහ සේවිකාවක් වන අයේෂා නාමලී මෙම සිදුවීම දුටු අතර එකෙණෙහිම අනතුරු ඇඟවීමත් සමග අන් අය සිදුවීමට මැදිහත් කර ගැනීමට සමත් වූවාය. චූදිතයා රැස්ව සිටි පිරිසගේ විරෝධතා හමුවේ එම සිද්ධියෙන් පලා යාමට මත්තෙන් , නොනවත්වා වින්දිතයාට පහර දෙන අයුරු සාක්ෂිකරුවන් කිහිප දෙනෙකුම දැක තිබිණි. චූදිතයා පැය පහකට පමණ පසුව එම වීදියේදී ම පොලිස් ග්‍රහණයට හසු කර ගන්නා ලදී. ජාතික රෝහලට රැගෙන යන විටත් සමන්මලී මියගොස් තිබුණු බව වාර්තා කෙරිණි.

මෙම නඩුව විනිශ්චය කරන විනිසුරුවරයා ඔබ යැයි උපකල්පනය කරන්න. ඇමරිකානු තත්වාකරවාදයේ දාර්ශනික මතවාද මත පදනම් වෙමින් අධිකරණ තීරණ සමාජ කරුණු මගින් බලපෑමකට ලක් වන්නේ කෙසේද ? ඒවායෙහි ප්‍රයෝගික ප්‍රතිපල මොනවාද ? සහ සැබෑ ජීවිතයේ නීතිය ක්‍රියාත්මක වන්නේ කෙසේද යන දෑ නිරූපණය කෙරෙන තර්කානුකූල විනිශ්චයක් ලියා දක්වන්න. අදාළ විනිශ්චිත නඩු තීන්දු සහ නීතිමය ප්‍රතිපාදන ඔබේ තර්කනයට සහාය කරගත හැකිය.

**( ලකුණු 25 යි )**

**05.** නව සුඛෝපභෝගී හෝටල් ව්‍යාපෘතියක් හේතුවෙන් ගාල්ල වෙරළබඩ නගරයේ අඩු ආදායම්ලාභී ධීවර පවුල් 30 කට අධික සංඛ්‍යාවක් අවම වන්දියකට යටත්ව සහ විකල්ප නිවාස ලබා දීමකින් තොරව සිය පාරම්පරික ඉඩම්වලින් බලහත්කාරයෙන් ඉවත් කරන ලදී. පැනනැගුණු විරෝධතා සහ මාධ්‍ය ආවරණ නොතකමින් බලධාරීන් විසින් එම ක්‍රියාව සාධාරණීකරණය කළේ 'නීත්‍යානුකූලව අනුමත වූ සංවර්ධන ක්‍රමෝපායක්' ලෙසිනි. මෙම ඉවත් කිරීම් අභියෝගයට ලක් කරමින් මහජන සුභසාධක නඩුකරයක් ගොනුකරන ලදී.

සමාජ විද්‍යාත්මක නීති ගුරුකුලයේ දෘෂ්ඨිකෝණය අනුසාරයෙන් මෙම සිදුවීම විශ්ලේෂණාත්මකව විග්‍රහ කරන්න. රෝස්කෝ පවුන්ඩ් සහ අනෙකුත් චින්තකයන්ගේ සංකල්ප අනුව යමින් නෛතික අයිතිවාසිකම්, ආර්ථික සංවර්ධනය සහ සමාජ සාධාරණත්වය යනාදී සන්දර්භයන් හි හටගන්නා ගැටීම් විෂයෙහි නීතිය ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය සාකච්ඡා කරන්න.

ඔබේ විශ්ලේෂණයට සහාය වීම පිණිස අවශ්‍ය අවස්ථාවන්හි දී නෛතික ප්‍රතිපාදන, විනිශ්චිත තීරණ හෝ සැබෑ ලෝකයේ උදාහරණ උපුටා දක්වන්න.

**( ලකුණු 25 යි )**

06. හාන්ස් කෙල්සන්ගේ නීතිය පිළිබඳ නිර්මලවාදය මගින් නීතිය යන ප්‍රපංචය සදාචාරය, දේශපාලනය සහ සමාජ විද්‍යාවෙන් වියුක්ත කිරීමට උත්සාහ දරන අතරම මූල නියාමයකින් **(Grundnorm)** අවසන් වන නියාමන ධේරාවලියක් ද යෝජනා කරයි. සමාජයීය, සදාචාරාත්මක හෝ දේශපාලනික බලපෑම්වලින් ස්වාධීන වූ නියාමන පද්ධතියක් වශයෙන් නීතිය තේරුම් ගත යුතු බවට වන කෙල්සන්ගේ අර්ථ දැක්වීම විවේචනාත්මකව විග්‍රහ කරන්න. තවද, ඔබගේ පිළිතුර තුළ නීතිය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන ආකාරය මෙම න්‍යාය මගින් ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය කර ඇත්ද යන්න පැහැදිලි කරන්න. ශ්‍රී ලංකාව සහ ඔබ කැමති වෙනත් ඕනෑම අධිකරණ බල ප්‍රදේශයකින් අදාළ උදාහරණ සපයමින් ඔබේ විශ්ලේෂණය තහවුරු කරන්න.

**( ලකුණු 25 යි )**

07. 'නීතිය පිළිබඳ මාක්ස්වාදී න්‍යාය නව සහ විචල්‍ය සංයෝජනවලට ගැළපෙන පරිදි ප්‍රතිනිර්මාණය කර ඇති සාමාන්‍ය තේමාවන් ගණනාවක් ප්‍රදර්ශනය කරයි. සාරාංශ වශයෙන් ගත් කල, මාක්ස්ගේ ලේඛනවල සහ නීතිය පිළිබඳ පසුකාලීන මාක්ස්වාදී ප්‍රවේශයන් තුළ ගැබ් වී ඇත්තේ නීතිය පවතින ආර්ථික සම්බන්ධතාවයන්ට බලාත්මක භාවයක් ලබා දෙන හෝ ප්‍රතිබිම්බනය කරන හෝ වෙනත් ආකාරයකට ප්‍රකාශ කරන්නක් වශයෙනි.'

Hunt, Alan. 'Marxist theory of law.' (2010) A companion to philosophy of law and legal theory.

මෙම ප්‍රකාශය සමග ඔබ එකග වන්නෙහි ද?

නීතිය පිළිබඳ මාක්ස්වාදී න්‍යායේ සමකාලීන අදාලත්වය සුදුසු උදාහරණ සහිතව විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

**( ලකුණු 25 යි )**

*** සියලුම හිමිකම් ඇවිරිණි ***